`

ශීර්ෂය 213 - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 අගෝස්තු 18 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ දක්වා ඇති රු.92,145,416 ක් වටිනා හෝමාගම පිටිපන පිහිටි පෙළපොත් ගබඩා සංකීර්ණය ඉදිකර තිබෙන ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් තහවුරු කරගෙන නොතිබුණි.	එකඟ වෙමි. එම ඉඩමට අදාළව හෝමාගම දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එහි තීන්දුව ලද පසු පැවරීම් කටයුතු සිදු කළ හැකි බව හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව.	ඉඩමේ නීත්‍යාණුකූල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීම වෙනුවට රු.98,898,638 ක් වූ ඉඩම සහ රු.181,197,063 ක් වටිනාකමැති ගොඩනැගිලි එකම ගිණුමක් තුළ ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ වෙමි. 2025 වර්ෂයට අදාළ අවසාන ගිණුම් සැකසීමේ දී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් වෙන් වෙන්ව දැක්වීමට කටයුතු කරන බව.	මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(iii)	අනුමත අත්තිකාරම් ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රයේ සඳහන් වත්කම්වල අගයන් හා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය (SA 82) අතර ස්ථාවර වත්කම් අයිතම 05 ක අගයන්හි රු.56,249,216 ක වෙනසක් පැවතුණි.	එකඟ වෙමි. සිගාස් දත්ත පද්ධතියට වත්කම් ඇතුළත් කර ඇත්තේ 2016 වර්ෂයේ සිට වන අතර, එම වර්ෂයේ පැවති වත්කම් එවකට පැවති අගයට තක්සේරු කර සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇත. එහෙත් අනුමත අත්තිකාරම් ගිණුමේ 1963 වර්ෂයේ සිට මිල දී ගත් වත්කම් පිරිවැයට ඇතුළත් කර ඇත. එබැවින්, මෙම ගිණුම් දෙකෙහි	-එම-

		වත්කම් අගයන් අතර වෙනසක් පවතින බව, ආයතනයට මිල දී ගෙන, වත්කම් නොවන අගයන් ද අතීතයේ දී වත්කම් ලෙස ඇතුළත් කර ඇති බව. එබැවින්, ගිණුම් දෙකේ වත්කම් අතර වෙනසක් පවතින බව සහ 2021 වර්ෂයේ සිට අලුතින් මිල දී ගන්නා ලද වත්කම් සිගාස් පද්ධතිය හා සසඳමින් අනුමත අත්තිකාරම් ගිණුමට ඇතුළත් කර ඇති බව.	
(iv)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ දෙපාර්තමේන්තුව සඳහා තොග පොත් කළමනාකරණය, බෙදාහැරීම සහ ලේඛන පවත්වාගෙන යාම සඳහා වූ ස්වයංක්‍රීය පරිගණක පද්ධතියක් සංවර්ධනය කර ස්ථාපිත කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.8,022,000 ක් වැයකර තිබුණු නමුත් එය අනුමත අත්තිකාරම් ගිණුමේ හා දෙපාර්තමේන්තු මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ මූල්‍ය නොවන වත්කම්වල කෙරීගෙන යන වැඩ යටතේ හඳුනාගෙන අනාවරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	එකඟ නොවෙමි. මෙම වැය විෂය සිගාස් පද්ධතිය හරහා වත්කමක් ජනනය නොවන වැය විෂයයක් බැවින්, මෙම වියදම් සිගාස් හි වත්කම්වල Working Progress (කෙරීගෙන යන වැඩ) යටතේ සටහන් කළ නොහැකි බව. මෙම ස්වයංක්‍රීය පද්ධතිය සඳහා සම්පූර්ණ ගෙවීම් අවසන් කර අදාළ පද්ධතිය පවරාගත් පසු භාණ්ඩාගාරය සමඟ සම්බන්ධ වී වත්කමක් ලෙස ඇතුළත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම යටතේ සඳහන් කර්තව්‍යයන්ගේ තීරණවලටප්‍රමාණාත්මක බලපෑම් සිදුකරන කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 113(6)(ආ) ප්‍රකාරව සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් 2024 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු එකතුව රු. 389,633 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර මෙම ණය ශේෂ අවුරුදු 11 සහ 23 කාල සීමාවකට අයත්ව තිබුණි.	එම නිලධාරීන් දෙදෙනාගෙන් මුදල් අයකර ගැනීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව.	ණය මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.

(ඇ) වාණිජ අත්තිකාරම් ගිණුම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**වියදමේ උපරිම සීමාව** සමාලෝචිත වර්ෂයට අදාළව අනුමත අත්තිකාරම් ගිණුමේ වියදමේ උපරිම සීමාව රු.20,000,000,000 ක් අනුමත කර තිබුණු නමුත් වර්ෂයේ තත්‍ය වියදම රු.8,577,841,837 ක් වූයෙන් රු.11,422,158,163 ක විචල්‍යතාවයක් පැවතුණි.	එකඟ වෙමි. ඩොලරයේ මිල අඩුවීම නිසා කඩදාසි හා අනෙකුත් මුද්‍රණ ද්‍රව්‍යවල මිල අඩුවීම හේතුවෙන් විවෘත ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළින් තීරණය වූ මිල ගණන් අඩුවීම හා 1,6,10 ශ්‍රේණිවල සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මොඩියුල මුද්‍රණය කිරීම වෙනුවට පෙළපොත් නැවත භාවිතයට ඉඩ සැලසීම මත මුද්‍රණය කළ යුතු පොත් ප්‍රමාණය අඩුවීම යන කරුණු හේතුවෙන් වියදම අඩුවී ඇති බව.	පෙළපොත් නැවත භාවිතය, නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ද සැලකිලිමත්ව මුද්‍රණය කළ යුතු පිටපත් සංඛ්‍යාව තීරණය කරමින් ඇස්තමේන්තු පිලියෙල කළ යුතු බවත්, ඒ අනුව අනුමත සීමාවන් හා සත්‍ය සීමාවන් අතර විචලතා අවම වන ලෙස පිලියෙල කිරීමට කටයුතු කල යුතුය.
(ii)	**බැර කළ යුතු ලැබීමේ අවම සීමාව** සමාලෝචිත වර්ෂයට අදාළව අනුමත අත්තිකාරම් ගිණුමේ බැරකළ යුතු ලැබීමේ අවම සීමාව රු.20,000,000,000 ක් අනුමතකර තිබුණු නමුත් පසුව එම සීමාව රු.8,500,000,000 ක් ලෙස සංශෝධනය කරගෙන තිබුණු අතර තත්‍ය ශේෂය රු. 8,843,651,466 වී තිබුණි ඒ අනුව මුල් ඇස්තමේන්තුව හා සංශෝධිත ඇස්තමේන්තුව සමග තත්‍ය ශේෂය සැසඳීමේ පිළිවෙලින් රු.11,156,348,534 ක විචලතාවයක් හා රු.343,651,466 ක සෘණ විචලතාවයක් පැවතුණි.	එකඟ වෙමි. පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම සම්බන්ධව 126-1-2-4-1501 වැය විෂය යටතේ දරනු ලබන වියදම සහ පොත් අලෙවි මධ්‍යස්ථානවල පොත් අලෙවි ආදායම මෙම ගිණුමේ ආදායම ලෙස සලකනු ලබන බව. පෙළපොත් වියදම අඩුවීම, අවම ලැබීම් සීමාව වෙත ළඟා වීමට නොහැකි වී ඇති බව.	- එම -
(iii)	**හර ශේෂයේ උපරිම සීමාව** සමාලෝචිත වර්ෂයට අදාළව අනුමත අත්තිකාරම් ගිණුමේ හර ශේෂයේ උපරිම සීමාව රු.18,000,000,000 ක් අනුමත කරගෙන තිබුණු අතර හර ශේෂයේ තත්‍ය අගය රු.6,011,290,857 ක් වූයෙන් රු.11,988,709,143 ක විචල්‍යතාවයක් පැවතුණි.	එකඟ වෙමි. ඉහත (i) හා (ii) කරුණු හේතුවෙන් අනුමත අත්තිකාරම් ගිණුමේ උපරිම හර ශේෂ සීමාවට ළඟාවීමට නොහැකි වී ඇති බව.	- එම -

(iv)	**බැරකම් පිළිබඳ උපරිම සීමාව** සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අත්තිකාරම් ගිණුමේ බැරකම් පිළිබඳ උපරිම සීමාව රු.10,000,000,000 ක් අනුමත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ තත්‍ය බැරකම් රු.1,364,619,468 ක් වූයෙන් රු.863,538,053 ක විචල්‍යතාවයක් පැවතුණි.	එකඟ වෙමි. වියදම් සීමාව අනුව මෑත වර්ෂවල අත්දැකීම් හා උපරිම වියදම් සීමා පිළිබඳ සැළකිල්ලට ගෙන උපරිම බැරකම් සීමාව තීරණය කල ද වියදම් අඩුවීම හා අදාල වර්ෂය තුල බොහොමයක් ගෙවීම් සිදු කළ හැකිවීමෙන් බැරකම් පිළිබඳ උපරිම සීමාවට ලඟාවිය නොහැකි වී ඇති බව.	- එම -

(ඈ) අග්‍රිම ශේෂය

විගණන නිරික්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
භාණ්ඩාගාරය හා දෙපාර්තමේන්තු පොත් අනුව 2024 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු. 720,896 ක් වූ නමුත් එම ශේෂය මූල්‍ය ප්‍රකාශනවල අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයේ 2024 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය තීරුවේ නොපියවූ අග්‍රිම ශේෂය ලෙස දක්වා නොතිබුණි. එම අග්‍රිම ශේෂය වූ රු.720,896 ක වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණු නමුත් "ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2024 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය" යටතේ දක්වා තිබුණි.	එකඟ වෙමි. එය ප්‍රේෂණයකරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2024 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය තීරුවේ වැරදීමකින් සටහන් කර ඇති බව.	නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුය.

(ඉ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරික්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	එකඟ නොවෙමි. ස්ථාවර වත්කම් ලේඛනය මේ වන විට නිසි පරිදි යාවත්කාලීන කර ඇති බව.	ස්ථාවර වත්කම් ලේඛනය සිගාස් පරිගණක වැඩසටහන හා ඉන්වෙන්ට්‍රි ලේඛන වලට අනුකූල වන පරිදි යාවත්කාලීන කර පවත්වා ගැනීමට කටයුතු කල යුතුය.

(ඊ) විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් 7 දෙනෙකුට රු. 646,432,104 ක් ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් එදිනට ශේෂ සනාථන, ණයහිමියන් 6 දෙනෙකු පමණක් ඉදිරිපත් කර තිබුණු අතර ඒ අනුව ණයහිමි ශේෂය හා ශේෂ සනාථන ඉදිරිපත් කළ ණයහිමි ශේෂය අතර රු. 561,004,034 ක වෙනසක් පැවතුණි. ඒ අනුව ශේෂ සනාථන ඉදිරිපත් නොකල රු. 561,004,034 ක ණයහිමි ශේෂවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.	මුද්‍රණ ආයතනය 04 ක්, ගෙවිය යුතු බවට දක්වා ඇති පොත් 10 ක වටිනාකම 2024 දෙසැම්බර් මස ගෙවා ඇති බව, මුද්‍රණ ආයතනය ක් පොත් 04 ක වටිනාකම ඇතුලත් කර නැති බව, මුද්‍රණ ආයතනය ක් සඳහා රු 65,232,848 වටිනාකම ගෙවිය යුතුව ඇති බව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ඇතුලත් කර ඇති ණය ලේඛණයෙහි අධ්‍යාපන අමාත්‍යාංශයට අදාළ ගෙවීම් ද 213 වැය විෂයයට අදාල වියදම්ද ඇතුළත් කර ඇති බව, මුද්‍රණ ආයතනයක් පෙන්වා දී ඇති මුදල තුල 2013, 2014 වර්ෂවලට අදාල වටිනාකම් ද ඇතුලත් කර ඇති නමුත් අපගේ ලේඛන අනුව එම වර්ෂය සඳහා ගෙවිය යුතු ශේෂයක් නොමැති බව හා ණයහිමි වටිනාකම් තුල 2024 වර්ෂයට අදාළ ණයහිමි වටිනාකම් පමණක් ඇතුලත් බව.	ණයහිමි ශේෂවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට කටයුතු කල යුතුය.

1.6.2 පෙළපොත් කළමනාකරණ ක්‍රමවේදයන්හි අභ්‍යන්තර පාලන දුර්වලතා ප්‍රමානවත් මට්ටමක පැවතීම.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
1-11 ශ්‍රේණිවල පාසල් සිසුන් සඳහා නොමිලයේ පෙළපොත් ලබාදීම 1980 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. ඒ අනුව 2020 සිට 2024 දක්වා වසර 05 ක කාලය තුල ජාතික පාසල් හා පළාත් පාසල් 10,096ක් හා පිරිවෙන් 822ක් සඳහා පෙළපොත් වර්ග 412 කට අදාල පිටපත් එකතුව මිලියන 172 ක් රු.මිලියන 36,077ක් වැයකර පාසල් සිසුන් අතර නොමිලේ බෙදා දී තිබුණි. 1-11 ශ්‍රේණි සඳහා 2017 වර්ෂයේ පෙළපොත් නැවත භාවිතය හැකි උපරිම කාලයක් දක්වාද 2008,2020 හා 2022 වර්ෂවලදී එක් වර්ෂයක මුද්‍රිත පෙළපොත් පිටපත් සංඛ්‍යාවෙන් සියයට 30 සිට 60 දක්වා පරාසය තුල වූ ප්‍රතිශතයක් ඊළග වර්ෂයේදී නැවත භාවිතා කලයුතු බව චක්‍රලේඛ මඟින්	එකඟ වෙමි. 2017 මාර්තු 23 හා 2020 සැප්තැම්බර් 28 දිනැති චක්‍රලේඛ මේ වන විට අවලංගු කර ඇති බව 2022 සැප්තැම්බර් 22 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 29/2022 මේ වන විට ක්‍රියාත්මක වන බව. නමුත් පාසල් ක්‍රියාත්මක කිරීමේ දී හා පළාත්, කලාප මට්ටමේ අධීක්ෂණ ක්‍රියාවලියේ දී දුර්වලතා පවතින බව. නිකුත් කරන ලද චක්‍රලේඛ සියල්ල සමාලෝචනය කර නව චක්‍රලේඛයක් නිකුත් කිරීමටත් ඒ අනුව ක්‍රියාත්මකවීමටත් අපේක්ෂා	වාර්ෂික පෙළපොත් මුද්‍රණය කළ යුතු පිටපත් සංඛ්‍යාව තීරණය කිරීමට පෙර සැලසුම් අදියරේ සිට මුද්‍රණය, බෙදාහැරීම, නිකුත් කිරීම, නැවත භාවිතය හා පෙළපොත් අපහරණය දක්වාත්, මූල්‍ය ප්‍රකාශන වල එම තත්ත්වයන් ගිණුම්ගත වන පරිදි හා අනාවරණය කළ යුතු තොරතුරු අනාවරණය කළ හැකි පරිදි නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලටද සමගාමීව සිසුන්, දෙමව්පියන්, ගුරුවරුන්ද

විධිවිධාන පනවා තිබුණද 2020 - 2024 කාලසීමාවට අදාල සමස්ත දත්ත පරීක්ෂාවේදී සත්‍ය වශයෙන් පෙළපොත් ඊළග වර්ෂයේදී නැවත භාවිතා කිරීමේ ප්‍රතිශතය සියයට 08 සිට 24 දක්වා වූ අවම පරාසයක පැවතුණි. පෙළපොත් නැවත භාවිතය පිළිබඳව 2008 වර්ෂයේ සිට චක්‍රලේඛ මගින් උපදෙස් ලබා දී තිබුණු නමුත් 2025 ජූනි 30 දිනවන විටත් විෂය නිර්දේශය වෙනස් වනතුරු හැකි උපරිම කාලයක් දක්වා පෙළපොත් නැවත භාවිතය දිරිගන්වන පරිදි චක්‍රලේඛ විධිවිධාන පනවමින් ඒ අනුව සිසුන් හා ගුරුවරුන් අභිප්‍රේරණය කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. ආරම්භයේ සිටම පෙළපොත් නැවත භාවිතය පිළිබඳව බලධාරීන් විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම හේතුවෙන් රජයේ මුදල් විශාල වශයෙන් නාස්ති වී තිබුණු අතර ඒ හේතුවෙන් නිරීක්ෂණයට ලක්කරන ලද අවස්ථා 04 ක් තුළ පෙළපොත් නැවත භාවිතය නියම කරන ලද පරිදි සිදු නොකිරීම හේතුවෙන් රු. මිලියන 2,192 ක අලාභයක් සිදු වී තිබුණි.	කරන බව සහ පෙන්වාදී ඇති කරුණු නිවැරදි කර ගැනීම සඳහා නව චක්‍රලේඛයක් හා මාර්ගෝපදේශයන් කෙටුම්පත් කිරීම සඳහා මූලික සාකච්ඡා ආරම්භ කර ඇති බව.	ඇතුළු ආයතන ප්‍රධානීන් හා විවිධ කළමනාකරණ මට්ටම් සඳහා නිශ්චිත කාර්යයන් හා වගකීම් පවරමින්, අධීක්ෂණ හා දිරිගැන්වීම් වැඩපිළිවෙලක් සහිත ක්‍රමවේදයන් ස්ථාපිත කර තිරසර දරුවෙකු නිර්මාණයට අවශ්‍ය ආකල්පමය වෙනසක් හා රාජ්‍ය මුදල් අපතේ යාම වැළැක්වීමටත් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී ප්‍රමාණාත්මක අවධානයක් යොමු කිරීමට කටයුතු කල යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
154 (6) වාර්තාවේ 1.6.1 (ආ) (i)	ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගත යුතුය.	1.6.1 (අ) (1)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2009 වර්ෂයේ සිට සීමාසහිත ජාතික කඩදාසි සමාගම වෙතින් අයවිය යුතු රු. 7,431,012 ක මුදල විගණිත දිනය වූ 2025 මැයි 05 දින විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	එකඟ වෙමි. මෙම මුදල් කොටස් වශයෙන් ගෙවීම් කරන ලෙස දන්වා නිරන්තරයෙන්, ලිපි යොමු කළ ද, මේ වන තෙක් ගෙවීම් කිරීමට කටයුතු කර නොමැත. 2024 අප්‍රේල් 08 දිනැති ලිපිය මඟින් ද හිඟ මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇති අතර, කර්මාන්ත හා ව්‍යවසායකත්ව අමාත්‍යාංශය විසින් 2024 අප්‍රේල් 23 දිනැතිව සී/ස ජාතික කඩදාසි සමාගමේ සභාපති අමතා ගෙවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇති බව.	ලැබිය යුතු ශේෂ නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 15 ක් සඳහා වෙන්කර තිබුණු රු. 84,947,800 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 36,869,414 ක් ඉතිරි ව පැවතුණු අතර ඉන් වැය විෂයයක ඉතිරිය සියයට 100 ක් ද වැය විෂයයන් 14 ක ඉතිරිය සියයට 13 ත් සියයට 60 ත් අතර පරාසයක ද විය. ඒ අනුව ප්‍රායෝගික තත්ත්වයෙන් බැහැරව සිදුකරන ලද සැලසුම් හා දුර්වල ඇස්තමේන්තුකරණය සමාලෝචිත වර්ෂයේ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් ඉතිරිවීමට මූලිකවම හේතු වී තිබුණි.	වැය විෂයයේ සියයට 100 ක ප්‍රතිපාදන 2024 වර්ෂය තුළ ඉල්ලීමක් ඉදිරිපත් නොවීම නිසා ඉතිරි වී ඇති බව.	මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව, ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	2022, 2023 හා 2024 වර්ෂවලදී විදුලිය හා ජලය වැය විෂයෙහි පිලිවෙළින් රු. 2,850,000 ක් රු.3,500,000 ක් හා රු.6,000,000 ක් වශයෙන් ශුද්ධ ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණු අතර, වියදම පිළිවෙලින් රු. 2,240,435 ක්, රු. 1,500,000 ක් හා රු. 2,399,652 ක් වශයෙන් වූ අතර ඒ අනුව ඉතිරිය සියයට 20 ක්, 57 ක් හා 60 ක් වශයෙන් වී තිබුණි. ඉතිරිවීම්වලට හේතු යටතේ "අධ්‍යාපන අමාත්‍යාංශ පිහිටි ගොඩනැගිල්ලේම අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පිහිටීම නිසා විදුලි වියදම අධ්‍යාපන අමාත්‍යාංශ විසින් දැරීම"යනුවෙන් වර්ෂ තුනෙහිම එකම හේතුව දක්වා තිබීම සහ අඛණ්ඩවම අනවධානයෙන් යුතුව ප්‍රතිපාදන වෙන්කර තිබීම හේතුවෙන් විදුලිය හා ජලය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යන ආයතන 02 කම ප්‍රතිපාදන වෙන්කර තිබීම, ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වී තිබුණි. මේ ආකාරයට ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කිරීම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අහිතකර බලපෑමක් වීමටද හේතු වී තිබුණි.	පෙර වර්ෂවල සිදුවූ අඩුපාඩුකම් මගහරවා ගැනීම සඳහා විදුලිය, ජලය සඳහා 2025 වර්ෂයේ වෙන් වෙන් කාර්තු වශයෙන් ප්‍රතිපාදන ලබා දෙන ලෙස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කර ඇති ඉල්ලීමට 2025 වර්ෂයේ පළමු කාර්තු 02 සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු සිදුකර ඇති බව.	-එම-

3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරික්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අනුමත අත්තිකාරම් ගිණුම තුළ 2024 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු එකතුව රු. 2,148,234 ක් වූ ගෙවිය යුතු ශේෂ දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර විගණනයට ඉදිරිපත් කරන ලද පිළිතුරෙහි එම බැරකම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති බව සඳහන් වුවද අමාත්‍යාංශය විසින් ද රු. 2,148,234 ක් වූ මුදල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	එකඟ නොවෙමි. මෙම අගයන් 213 වැය ශීර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් නොකරන ලද්දේ ඒවා 126 වැය ශීර්ෂයට අදාළ වියදම් වන බැවිනි. අධ්‍යාපන අමාත්‍යාංශයට දැනුම් දී ඇති බැරකම්වලින් ගිණුම් ඉදිරිපත් කරන අවස්ථාව වන විට පෙර වර්ෂයට අදාළව ගෙවීම් කරන ලද අගයන් පමණක් අනුමත අත්තිකාරම් ගිණුමේ බැරකම් ලෙස ඇතුළත් කර ඇති බව.	සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හා අනාවරණය කිරීමට කටයුතු කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශය	නිර්දේශය
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3 වන ඡේදය අනුව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යාපන අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය 2024 පෙබරවාරි මස 05 දින ලබාගෙන තිබුණි.	එකඟ වෙමි. 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ පළමු කෙටුම්පත 2023 අගෝස්තු 16 දින සකස් කර පැවතියත්, සම්මත වූ ප්‍රතිපාදනයන්ට අනුකූලව සකසන ලද ක්‍රියාකාරී සැලැස්ම - 2024 නියමිත දිනයන්හිදී ලේකම්තුමාට අනුමැතියට ඉදිරිපත් කිරීමට නොහැකිවූ බව සහ ඉදිරියේදී නියමිත දිනට එම කාර්යය සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දී ඇති අතර, 2025 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනයට සකසා අධ්‍යාපන ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඇති බව.	ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදයේ මාර්ගෝපදේශ අංක 12 හි දැක්වෙන පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කර නොතිබුණි.	එකඟ වෙමි. දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම සකසා තිබුණ ද එය ක්‍රියාකාරී සැලැස්ම තුළට ඇතුළත් කිරීම මගහැරී ගොස් තිබූ අතර, ඉදිරියේදී අදාළ චක්‍රෙල්ඛ පරිදි නිවැරදිව සිදු කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා දී ඇති බව සහ 2025 වර්ෂයේ සැලැස්ම තුළ අදාළ තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු යොදා ඇති බව.	වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් කිරීමට කටයුතු කල යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශය	නිර්දේශය
1, 6 සහ 10 ශ්‍රේණිවලට බෙදාහැරීම සඳහා පිටිපන ගබඩාව තුළ පැවති පෙළපොත් පිටපත් 8,163,004 ක ප්‍රමාණයකින් 2025 ජනවාරි 26 දින වන විට පෙළපොත් පිටපත් 2,695,812 ක ප්‍රමාණයක් එනම්	එකඟ වෙමි. 1,6 හා 10 ශ්‍රේණි සඳහා පෙළපොත් මුද්‍රණය ආරම්භ කරන ලෙස අධ්‍යාපන ලේකම්ගේ 2024 ඔක්තොම්බර් 02 දිනැති ලිපිය මඟින් ලබාදුන් නියෝග අනුව මුද්‍රණාලය	පලමු පාසැල් වාරය ආරම්භ කිරීමට පෙර පෙළපොත් බෙදාහැරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කල යුතුය.

සියයට 33 ක ප්‍රමාණයක් පමණක් පාසල් වෙත බෙදාහැර තිබුණු බවත්, පිටපත් 5,467,192 ක ප්‍රමාණයක් එනම් සියයට 67 ක ප්රමාණයක් තවදුරටත් පාසල් වෙත බෙදාහැරීම සඳහා ගබඩාවේ තිබුණු බවත්, නිරීක්ෂණය විය. ඒ අනුව 2025 පලමු පාසැල් වාරය වූ 2025 ජනවාරි 27 දින පාසැල් ආරම්භ කිරීමට පෙර පෙළපොත් බෙදාහැරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	වෙත 2024 දෙසැම්බර් 23 දින ඇණවුම ලබා දී ඇත. ඒ අනුව ගබඩාව වෙත පෙළපොත් ලබා දීමේ අවසාන දිනය ජනවාරි 22 වේ. දිනකට බෙදාහැරීම් කළ හැකි පොත් ප්‍රමාණය ලක්ෂ 2-3 පමණ වේ. 1,6,10 ශ්‍රේණි පෙළපොත් සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රමාදය නිසා මුද්‍රණය ප්‍රමාදවීම මෙම නිරීක්ෂණයට හේතුවී ඇති අතර එය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට පාලනය කළ හැකි කරුණක් නොවූ බව සහ2026 වර්ෂය සඳහා ප්‍රමාදයකින් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇති අතර මේ සම්බන්ධව මූලික සාකච්ඡා ආරම්භ කර ඇති බව.

4.3 විදේශ ආධාර ව්‍යාපෘති

4.3.1 සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශ ය	නිර්දේශය
(i)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ (GEMP) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය, බෙදාහැරීම හා ලේඛන පවත්වා ගැනීම සම්බන්ධ ස්වයංක්‍රීයකරණ පද්ධතිය (Office Automation System) සංවර්ධනය කර ස්ථාපිත කිරීම සඳහා රු.14,200,000 ක් වෙන්කර තිබුණි. එම ව්‍යාපෘතිය 2023 මාර්තු 15 දින ආරම්භ කර 2024 මැයි 15 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් 2025 අප්‍රේල් 30 වන විටත් මාස 11 ක ප්‍රමාදයක් පැවතියද වැඩ අවසන් වී නොතිබුණි.	එක් එක් පියවරයන් සඳහා ගෙවීම් ප්‍රමාදවීම මෙම ව්‍යාපෘතිය ප්‍රමාද වීමට බලපා ඇති බව, 4 වන පියවර සඳහා මුදල් ගෙවීමට කාර්යසාධන බැඳුම්කරය හා ගිවිසුම කල් ඉකුත්වී තිබීම නිසා නොහැකි වූ බව, අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය අනුව කාර්ය සාධන බැඳුම්කරය සහ ගිවිසුම අළුත් කර 4 වන හා 5 වන පියවර සඳහා මුදල් ගෙවා ඇති බව සහ 6 වන පියවර සඳහා ගෙවීම සිදු කිරීමට ප්‍රථමයෙන් මෙම පද්ධතියෙහි සියලු වැඩ කටයුතු නිමකර ලබාගැනීමට අපේක්ෂා කරන බව.	ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් වල ප්‍රසම්පාදනයන් සැලසුම් අදියරේ සිටම මෙහෙයවීම හා අධීක්ෂණයට ලක් කරමින් ප්‍රගතිය කාලීනව සමාලෝචනය කර අපේක්ෂිත කාර්යසාධනය සමාලෝචිත වර්ෂය තුළ දී ළඟාකර ගැනීමට කටයුතු කල යුතුය.

(ii)	සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ (GEMP) අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන 04 ක පොත් අලෙවි කිරීම සඳහා විකුණුම් ස්ථාන පද්ධති ස්ථාපිත කිරීමට 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු.4,000,000 ක් වෙන්කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් උක්ත පද්ධති ස්ථාපිත කිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.	එකඟ නොවෙමි. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල බිල්පත් නිකුත් කිරීම සඳහා භාවිත කරන මෘදුකාංගය (S-poss) ව්‍යාප්ත කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිලධාරීන් පස්දෙනෙකු සමන්විත තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කරන ලදි. තාක්ෂණ ඇගයීම් කමිටු රැස්වීමේ දී ලබා දී ඇති අවශ්‍යතාවයන් සියල්ලම සැලකිල්ලට ගෙන මෘදුකාංගය (S-poss) මීට පෙර මිල දී ගත් ආයතනය වෙතින් පමණක් ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම යෝග්‍ය නොවන බවත් මේ සම්බන්ධව ඇති අනෙකුත් ආයතන වෙතින් ද මිල ගණන් කැඳවීම සුදුසු බවත් ඊට අදාළ අවශ්‍යතාවය හා පිරිවිතර නැවත ලබාගෙන ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු බවත් තීරණය කරන ලදී. එම තීරණය ලැබෙන විට 2024 වර්ෂය අවසන් වීමට ආසන්න වූ බැවින් එම වර්ෂයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බව.	-එම-

4.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශය	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති හා අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වෙනි අධිකාරියේ 4 වගන්තියට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්, ඇප තැබිය යුතු ප්‍රමාණය හා ඇප තැබිය යුතු ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්වරයාට කළ හැකි බව දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වාම දෙපාර්තමේන්තුවේ වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි.	ඇප තැබිය යුතු නිලධාරීන්ගේ ඇප තැබීමේ කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතින බව.	රාජ්‍ය මුදල් චක්‍රලේඛයට හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කල යුතුය.

4.5 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශය	නිර්දේශය
2024 අගෝස්තු 27 හා 2024 සැප්තැම්බර් 03 අතර දිනකදී දෙපාර්තමේන්තුවට අයත් අංක LM – 8681 දරණ ලොරි රථය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් රථ ගාලෙහි නවතා තිබියදී එම රථයේ බැටරි දෙක සොරාගෙන ගොස් තිබුණි. ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.	පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතින බව.	වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට සිදු වී ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කල යුතුය.

4.6 පොත් තොග සමීක්ෂණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශය	නිර්දේශය
(i)	2024 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණ වාර්තාවල සඳහන් සංඛ්‍යා හා අනුමත අත්තිකාරම් ගිණුමේ සඳහන් සංඛ්‍යා පරීක්ෂා කිරීමේදී පොත් 22 ක අතිරික්තයන් හා පොත් 996 ක ඌණතාවයක් පැවතුණි.	එකඟ වෙමි. ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් නිර්දේශ ලබාගැනීමට කමිටුවක් පත් කර ඇත. කමිටු වාර්තා ලද විගස ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට පිටිපන ගබඩාවේ තොග ලේඛන අනුව පිරිවෙන් පොත් පිටපත් සංඛ්‍යාව 223,111ක් තිබුණු නමුත් එම පිරිවෙන් පොත් තොගය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	එකඟ වෙමි. 2025 වර්ෂයේ අවසන් ගිණුම් සැකසීමේ දී, ජර්නල් සටහන් මඟින් පෙර වර්ෂයට අදාළ ආරම්භක ශේෂ හා රජයේ ආදායමට පැවරීමට ඇති ලාභ ශේෂ ගිණුමට ගලපා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	විගණන කටයුතු සඳහා නිශ්චිත වූ සමීක්ෂණ වාර්තා වගකීමෙන් යුතුව ලබාදිය යුතු බවත්, භාණ්ඩ සමීක්ෂණය නිවැරදිව සිදුකල යුතු බවත් ඒ සම්බන්ධව පාලනයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

4.7 කළමනාකරණ දුර්වලතා

4.7.1 අතිරේක පොත් මුද්‍රණය කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම නිර්දේශ ය	නිර්දේශය
(i)	අතිරේක පොත් සම්පාදනයේ දී පොතට ඇති ඉල්ලුම හා පොතෙහි අවශ්‍යතාවය පිළිබඳව තහවුරු කර නොගැනීම, නිම කිරීමට නියමිත කාලසීමාවන් ලබා නොදීම, පොතෙහි විෂය නිර්දේශය අනුව අතිරේක පොතක් හඳුන්වාදීමට තිබෙන සැබෑ අවශ්‍යතාව හා ඊට අදාල ලබාගත යුතු අනුමැතිය මූලිකව හඳුනාගැනීමකින් තොරව අතිරේක පොත් මුද්‍රණ කටයුතු ආරම්භ කර තිබුණි. එසේම අතිරේක පොතක ප්‍රමිතිය, ගුණාත්මක බව හා සම්පාදනය කළ යුතු කාලසීමාව යනාදිය පිළිබඳව තාත්ත්වික ක්‍රමවේදයකින් තොරව නිලධාරීන්ට කාර්යභාරය පැවරීම හේතු කොටගෙන පමණක් සිදුකර තිබුණි.	පොතට ඇති ඉල්ලුම හා පොතෙහි අවශ්‍යතාවය පිළිබඳව තහවුරු කරගනිමින් මේ වන විට අතිරේක පොත් සම්පාදනය කිරීමට කටයුතු කරමින් පවතින බව.	අතිරේක පොත් මුද්‍රණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමේ සිට අපහරණය දක්වා තත්ත්වයන්ට අදාලව මාර්ගෝපදේශයක් හඳුන්වා දීමට කටයුතු කල යුතුය.
(ii)	2024 අගෝස්තු 31 දින වන විට වර්ග 294 ක ක ප්‍රමාණයක් පිටිපන ගබඩා පරිශ්‍රයේ ගබඩා කර තිබුණු අතර එම පොත් මුද්‍රණය කර වසර 10 ක් හෝ ඊට වැඩි කාලයකට පෙර මුද්‍රණය කරන ලද පොත්වලින් සියයට 34 ක් හා 2015 සිට 2019 දක්වා මුද්‍රණය කරන ලද පොත්වලින් සියයට 40 ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් මෙසේ ගබඩාවේ ඉතිරි වී තිබුණි.	එකඟ වන බව.	-එම-